සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
கிராமப்புற மேம்பாடு , சமூக பாதுகாப்பு மற்றும் சமூக அதிகாரமளித்தல்
Ministry of Rural Development, Social Security and Community Empowerment

| මගේ අංකය<br>எனது இல<br>My No | ........................ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................ | දිනය<br>திகதி<br>Date | 2024.12.30 |
|---|---|---|---|---|---|

සියළුම ප්‍රජාමූල විධායක කමිටු/ බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමණාකරුවන්,

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ක්‍රියාත්මක වන පරිගණක මෘදුකාංගය සඳහා සර්වර් පහසුකම් හා SMS සේවාව වෙනුවෙන් සේවා ගාස්තු ගෙන්වා ගැනීම.</u>**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ජාලගත කිරීමේදී අවශ්‍ය වන සර්වර් පහසුකම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලබා ගෙන ඇති අතර, ඒ වෙනුවෙන් සෑම මාසයකම වැට් බදු මුදල් සමග රු. 7973614.50 ක මුදලක් එම ආයතනයට ගෙවීම් කළ යුතු ව ඇත.

02. සමෘද්ධි ප්‍රජාමූල බැංකු වල ගණුදෙනු කරන ගණුදෙනුකරුවන්ගේ මුදල් තැන්පත් කිරිමේදී හා ආපසු ලබා ගැනීමේ දී අදාළ ගණුදෙනුකරුගේ දුරකථනයට SMS කෙටි පණිවිඩයක් යැවීම හා පරිගණක මෘදුකාංග පද්ධතිය භාවිතා කරන නිළධාරීන්ගේ මුරපදද සකස් කළ පසු එම නිළධාරීයාට OTP අංකයක් දුරකථනයට ලබා දීම සඳහා 2025 වර්ෂයේ සිට නැවත SMS සේවාව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා එක් බැංකුවකින්/ බැංකු සමිතියකින් රු.300.00 ක මුදලක් ගෙවීම් කළ යුතුව ඇත.

03. ඒ අනුව, සර්වර් පහසුකම් හා SMS කෙටි පණිවිඩ සේවාව වෙනුවෙන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති 2025 වර්ෂය සඳහා රු. 70500.00 බැගින් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවිය යුතුය. ප්‍රජාමූළ බැංකු වෙතින් එම මුදල ගෙන්වා ගෙන බැංකු සමිතියේ වාර්ෂික සර්වර් ගාස්තුව ද එකතු කර දින 60 ක රේඛණය සහිතව කළමණාකරු, ලංකා බැංකුව, බත්තරමුල්ල ප්‍රජාමූල බැංකු අංශය - ආයෝජන ගිණුම ජංගම ගිණුම් අංක **3417925** ගිණුමට චෙක්පතකින් **පමණක්** පහත ආකෘතිය පරිදි බැංකු වල නාම ලේඛණයද සමග 2025.01.31 දිනට පෙර අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත එවිය යුතු වේ.

04. මීට අදාළව ගිණුම් සටහන් 2022.10.30 දින නිකුත් කරන ලද 2022/15 අංක දරණ චක්‍රලේඛණ උපදෙස් පරිදි තැබිය යුතුයි.

සී.ඩී කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

ආකෘතිය
**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ක්‍රියාත්මක වන පරිගණක මෘදුකාංගය සඳහා සර්වර් පහසුකම් හා SMS සේවාව වෙනුවෙන් සේවා ගාස්තු ගෙන්වා ගැනීම.</u>**

| බැංකු සමිතියේ නම | සර්වර් පහසුකම් එවන ලද බැංකුවේ නම | චෙක්පත් අංකය | එවන ලද සර්වර් ගාස්තු මුදල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |